# 2013 නොවැම්බර් - විශේෂ වැඩසටහන

"පුනරුත්පත්තියක් පිළිබඳව වන ප්‍රාර්ථනාව හා බලාපොරොත්තුව යනු ආගමික විශ්වාසයන්/ ආගමික ශික්ෂණයන් ඉක්මවා ගිය එකකි. එමෙන්ම ආගම් බිහිවීමට වඩා පැරණි ඉතිහාසයක් ඊට ඇති බවට වන මානව විද්‍යාත්මක සාක්ෂි අපට ඇත.

ආත්මීය අඛණ්ඩත්වය පිළිබඳව මනුෂ්‍යයාට ඇති අනුරාගය දෙවැනි වනුයේ මරණය පිළිබඳව වන වියෝ වේදනාවට පමණි. මනුෂ්‍යයාගේ ජීවන තත්වය ප්‍රගතිය කරා යනවිට එසේත් නැත්නම් ඔහුගේ සංස්කෘතික ජීවිතයේ පරාසය විශාල වනවිට , ජීවිතය යනු මෙපමණකැයි හිත හදා ගැනීම වඩාත් අසීරු වනු ඇත."

හිටපු අධ්‍යාපන අධ්‍යක්ෂ වරයෙකු/අධ්‍යාපන වෘත්තිකයෙකු වන ඒ.ඩී. ගුණසේකර මහතා විසින් සම්පාදිත , පුනරුත්පත්ති විශ්වාසය අරබයා වන විමර්ශනාත්මක කෘතිය එළිදැක්වීමේ අවස්ථාව 2013 නොවැම්බර් 19 අඟහරුවාදා ප.ව. 3.30 ට

කොළඹ මහජන පුස්තකාල ශ්‍රවනාගාරයේදී

පැවැත්වීමට කටයුතු සංවිධානය කොට ඇත.

මෙම කෘතිය පිළිගන්වනු ලබන්නේ

මහාචාර්ය කාලෝ ෆොන්සේකා මහතා වෙතටයි.

ප්‍රධාන දෙසුම පවත්වනු ලබන්නේ ,

විශේෂඥ වෛද්‍ය ආරියසේන යු. ගමගේ මහතා විසිනි.

දේශනය අවසානයේ වන සංවාදය සියලු දෙනා සඳහා විවෘත වේ.

තාරක වරාපිටිය

ලේකම්